NILIS

s

# පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Library and Information Management (පාඨමාලා කේතය: DLIM)

DLIM 2022/2023

### 1) හැඳින්වීම

වත්මන් තොරතුරු සමාජය තුළ තොරතුරු මනාව කළමණාකරණය කිරීමට පවත්නා හැකියාව ඕනෑම පුද්ගලයෙකුගේ අධ්‍යාපනික, වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වන තීරණාත්මක සාධකයක් වේ. මෙම කාර්යය සඳහා විධිමත් සහ කාර්යක්ෂම පුස්තකාල හා තොරතුරු සේවාවක් පැවැත්ම අත්‍යවශ්‍ය කොන්දේසියක් වන අතර, මෙහිදී පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන්නන්ට පැවරෙන භූමිකාව සුවිශේෂිය. ඔවුන් තොරතුරු යුගයේ අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් තම දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. දැනට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන සහ ඒම ක්ෂේත්‍රයට ඉදිරියේදී පිවිසීමට අපේක්ෂා කරන අය තොරතුරු යුගයට ගැලපෙන වෘත්තිකයන් බවට පත් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට සුදුසු අයුරින් මෙම පාඨමාලාව සැලසුම් කර තිබේ.

### 2) ඉලක්ක කණ්ඩායම

පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන හෝ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක් ඕනෑම අයෙකු සඳහා

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)

  **හෝ**

- අ.පො.ස (සා.පෙ.) සමත්වීම <u>**සහ**</u> ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන **මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) / මහජන පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACSL) / හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු පාඨමාලාලාභීන්ට


- සංවිධානයක තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීමට
- විවිධ සම්පත්වලින් තොරතුරු කාර්යක්ෂමව ගවේෂණය කිරීමට
- පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයක ලේඛන මනාව කළමනාකරණය කිරීමට
- ඉලෙක්ට්‍රොනික පරිසරයක් තුළ පරිගණක කාර්යක්ෂමව භාවිත කිරීමට

  හැකියාව ලැබෙනු ඇත.

### 5) පාඨමාලාවට අන්තර්ගත විෂයන්

1. පුස්තකාල හා තොරතුරු වෘත්තීය
2. තොරතුරු මූලාශ්‍ර හා සේවා
3. ලේඛන කළමනාකරණය
4. තොරතුරු කළමනාකරණය
5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය-1
6. ග්‍රන්ථවිද්‍යාත්මක සංවිධානය- 1
7. කාර්යාල යන්ත්‍ර භාවිතය
8. පුද්ගල සංවර්ධන කුසලතා
9. තොරතුරු වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි- 1
10. ව්‍යාපෘති වාර්තාව

6) **වැඩසටහනේ වැදගත්කම:** DLIM පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු කළමණාකරණ උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




7) **පාඨමාලා කාලය :** මාස 12

8) **මාධ්‍ය :** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **පන්ති පැවැත්වීම :** නැවත දැනුම් දෙනතුරු සියලුම පන්ති මාර්ගගතව (Online) පැවැත්වේ.

10) **ඇගයීම් ක්‍රමවේදය**

සෑම විෂයක් සඳහාම පැවරුම් ලබා දෙන අතර ලිඛිත විභාගයක් ද පැවැත්වේ. එක් එක් විෂය සඳහා 50% ක් පැවරුම් වලින්ද ඉතිරි 50% ලිඛිත විභාගයෙන් ද ලකුණු එකතු කරනු ඇත. මෙයට අදාළව ව්‍යාපෘතියද සම්පූර්ණ කළ යුතුය.

11) **පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම්.**

අවම වශයෙන් සියලු විෂයනට C සාමාර්ථයක් ලබා ගත යුතුය. එනම්, සෑම විෂයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය. විෂයන් තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට D හෝ E සාමාර්ථ තිබුණහොත් එම විෂයන් සඳහා පමණක් පුනර් පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

12) **පාඨමාලා ගාස්තුව**

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 28350/= කි.**

එම ගාස්තුව සම්පූර්ණයෙන් හෝ, මෙහි දැක්වෙන පරිදි වාරික දෙකකින් ගෙවිය හැකිය.

| වාරිකය | මුදල | ගෙවිය යුතු දිනය |
|---|---|---|
| **පළමු වාරිකය** | රු.16,600 | පාඨමාලාවට ලියාපදිංචි වීමට පෙර ගෙවිය යුතුය |
| **දෙවන වාරිකය** | රු.11,750 | පළමු සමාසික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය (මාස 06ක් ඇතුළත). |

13) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය: 2022 මැයි 31

14) පාඨමාලා ආරම්භය: 2022 ජූලි මස

15) **අයදුම් කරන ආකාරය**

- අයදුම්පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් (https://nilis.cmb.ac.lk) බාගත කරන්න.
- අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න
- අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 250.00 ක මුදලක් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ 086100101191736 අංක දරණ ගිණුමට බැර කර මුල් ලදුපත අයදුම් පත්‍රයේ ලබා දී ඇති කොටුවේ අලවන්න.
- ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අ.පො.ස./උ.පෙළ සහ අ.පො.ස./සා.පෙළ සහතික යන ලේඛනවල සහතික කළ පිටපත් අමුණන්න.
- ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පාඨමාලා කේතය ලියන්න.
- අයදුම්පත සහ අනෙකුත් ඇමුණුම් පහත ලිපිනයට තැපැල් කරන්න.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03.